## ඌවපරණගම ප්‍රාදේශීය සභාව

## 2022.04.07 වන දින පැවති මහා සභා වාර්තාව

**01.පිළිගැනීම**

මෙදින පෙ.ව.09.30 ට ආගම සිහි කිරිමෙන් පසු පැමිණ සිටි මන්ත්‍රී මණ්ඩලය ඇතුළු සියළු දෙනා ගරු සභාපතිතුමා විසින් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**02.පැමිණීම .**

| | |
|---|---|
| 1. කේ.ඒ.සමින්ද සුදර්ශන මැතිතුමා | ගරු සභාපති |
| 2. ඊ.සෝමා එදිරිසිංහ මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි |
| 3. ටී.එම්.මෛත්‍රීපාල තෙන්නකෝන් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 4. එම්. කාංචනා රුවන්මාලි මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි |
| 5. ඩබ්.ඒ.වසන්ත සුසිල් කුමාර මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 6. ජේ.එම්.බන්දුල ධර්මසිරි මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 7. ඩී.එම්. තිලකරත්න බණ්ඩා මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 8. ටී.ඒ.ශ්‍රීනාත් රාජිත තිලකරත්න මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 9. නාරායනන් වරදරාජ් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 10 ආර්.ඩබ්.ඩබ්.එම්.මානෙල් කුමාර මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 11. ආර්.එම් නාලිනි රාජපක්ෂ මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි |
| 12. ඩි.එම්.ලලිත් වසන්ත දිසානායක මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 13. ඩබ්.පි.සමන්ත වර්ණසූරිය මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 14. එස්.එම්.සුජීත් ප්‍රසන්න මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 15. කේ.එම්.කරුණාතිලක මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 16. එම්.එම්.අසංක කමල් බණ්ඩාර මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 17. ඩී.එම්. කරුණාදාස මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 18. ඒ.එම්.චමින්ද ලසන්ත අබේකෝන් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 19. එම්.ජී.ඒ සරත්චන්ද්‍ර මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 20. ඒ.එම්.මංජු ප්‍රියනාත් අබේකෝන් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 21. ඩබ්.එම්.උපාලි විරසිංහ මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 22.එම්.එම් සුනේත්‍රා නන්දනී මන්තිලක මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි |
| 23. කන්දසාමි පේරාම්බිගයි මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි |
| 24. එම්.එම්.නිර්මලා පුෂ්ප කුමාරි මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි |
| 25. ටී.බී. සුභසේන වීරසිංහ මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 26. එල්.එච්.ධර්මසේන මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 27. ඩබ්ලිව්.ජී.විජේසිංහ මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 28. එස්.අධෛකලම් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 29. ජී.දුලානි ධර්මා ගොඩකුඹුර මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි |
| 30 පුණ්‍යදාස සුගුණකුමාර් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 31. ඩි.එම්.කමල් දේශප්‍රිය මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 32. ජේ.එම්.තනුජා රසාංගිකා මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි |
| 33.ඩබ්.එම්. ප්‍රියන්ත බණ්ඩාර විජේතුංග මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

34. ඩබ්.එම් ජයසේකර මැතිතුමා. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
35. ටී.ඩබ්.ජී. උපසේන වැවේවත්ත මැතිතුමා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

**පසුගිය මහා සභා වාර්තාව සභා සම්මත කිරීම. –**

2022.03.10 දිනැති මහා සභා වාර්තාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඊ.සෝමා එදිරිසිංහ මැතිතුමියගේ හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.උපාලි වීරසිංහ මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**02.ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන :-**

- මාළු වෙළඳසැල් ටෙන්ඩර් කිරිමේ කමිටු රැස්වීම අද දින ප.ව.1.00ට පැවැත්වෙන බැවින්, මුදල් කමිටුවේ සිටින සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා /තුමියන්ලා එයට සහභාගි වන මෙන් නිවේදනය කරනවා.
- වැලිමඩ නගරයේ සමූපකාර ඉන්දන පිරවුම්හල අසල සිට ඔරලෝසු කණුව දක්වා අතුරු මාර්ගයක් ඉදිකිරිම සඳහා සැලසුම් සකස් කර අවසන් කර ඇති බැවින්,අතුරු මාර්ගයේ වැඩ අවසන් කිරිමෙන් පසු ඔරලෝසු කණුව අසල ඇති බස් නැවතුම්පලෙහි නව වැසිකිලි පද්ධතියක් ඉදිකිරිමට කටයුතු කරන බවත්, එතෙක් වැලිමඩ ප්‍රධාන බස් නැවතුම්පලෙහි වෙළඳ සංකීර්ණය හා සතිපොල භූමියේ පිහිටි ප්‍රාදේශීය සභා පොදු වැසිකිලි පද්ධති භාවිතා කිරිමට ඉඩ සලස්වා ඇති බව දන්වා එවා ඇති බව මෙයින් නිවේදනය කර සිටිනවා.
- වැලිමඩ,බදුල්ල පාර,ශිරෝමි ට්‍රේඩර්ස් වෙතින් වෙළඳපොලේ ලිට්රෝ ගෑස් මිල වැඩිවීම නිසා සපයනු ලබන ලිට්රෝ 37.5Kg ගෑස් සිලින්ඩරයක නව මිල 2022.04.05 වන දින සිට රු.18000.00ක් ලෙස දන්වා එවා ඇති බව නිවේදනය කරන ලදි.
- ගරු ප්‍රාදේශීය සභා උප සභාපති,ආර්.ඩී.ගුණපාල මැතිතුමා අසනිප තත්වයෙන් පසු වන බැවින් අද දින සභා වාරය සඳහා නොපැමිණෙන බව දන්වා එවා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලද අතර ඒ අනුව අදාල නිවාඩුව අනුමත කරන ලදී.
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි,ඒ.පි.අසේල ඉන්ද්‍රානන්ද මැතිතුමා අසනිප තත්වයෙන් පසු වන බැවින් අද දින සභා වාරය සඳහා නොපැමිණෙන බව දන්වා එවා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලද අතර ඒ අනුව අදාල නිවාඩුව අනුමත කරන ලදී.

  පෙ.ව. 9.40ට ගරු ඒ.එම්.මංජු ප්‍රියනාත් මැතිතුමා සහ ගරු එම්.ජී.ඒ.සරත්චන්ද්‍ර මැතිතුමා සභාවට පැමිණෙන ලදි.

**03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද පෙත්සම්,පැමිණිළි හා සන්නිවේදන ලිපි;-**

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පි.සමන්ත වර්ණසූරිය මැතිතුමා -** ඌවපරණගම, බුස්දුල්ල, සමහිතරු ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් විසින් බුස්දුල්ල ග්‍රාම සේවා වසමේ පොදු සුසාන භූමිය මැනීම් කටයුතු කර ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලද අතර 50% මූල්‍ය දායකත්වය මත මැනුම් කටයුතු කිරිම සඳහා මිළ ගණන් කැඳවා අදාල සමිතියට දැන්වීමට තීරණය කරන ලදී.
- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටි.ඒ.ශ්‍රීනාත් රාජිත තිලකරත්න මැතිතුමා -** අඹගහවත්ත,අමුණේකඳුර,ගල්කොටුව අමුණේකඳුර එක්සත් සහන සේවා සමිතියේ සභාපති විසින් පොදු සුසාන භූමිය මැනීම් කටයුතු කර ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලද අතර 50% මූල්‍ය දායකත්වය මත මැනුම් කටයුතු කිරිම සඳහා මිළ ගණන් කැඳවා අදාල සමිතියට දැන්වීමට තීරණය කරන ලදී.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. වසන්ත සුසිල් කුමාර මැතිතුමා- වැලිමඩ,කැන්දගොල්ල,එන්.බී.ඒ.චරිත ප්‍රභාත් මධුභාෂණ ශිෂ්‍යයා විසින් 2022 වර්ෂයේ දකුණු ආසියාතික රට හරහා දිවීමේ තරඟයෙන් රිදී පදක්කමක් ලබා ගත් බවත්, ඔහුට අවශ්‍ය ක්‍රීඩා ඇඳුම් සහ පාවහන් ලබා ගැනීම සම්බන්ධයෙන් ප්‍රතිපාදන මුදලක් වෙන් කිරීම සම්බන්ධව සහ පිළිගැනීමේ උත්සවය වෙනුවෙන් සභාවේ කැබ් රථය ලබා දීම සම්බන්ධයෙන්ද ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට ස්තූතිය පල කර ඇති ලිපිය සභාගත කරන ලදි.

පෙ.ව. 9.42ට ගරු ටී.එම්.මෛත්‍රීපාල තෙන්නකෝන් මැතිතුමා සභාවට පැමිණෙන ලදි.

**04.යථාපරිදි කල් දී ඇති ප්‍රශ්ණ :- නැත**

**05.යථාපරිදි කල් දීඇති යෝජනා :-**

**<u>යෝජනා අංක 01. - සමිති ලියාපදිංචි කිරීම.</u>**

2019.07.22 වන දින පැවති ප්‍රජා සංවර්ධන කමිටුවේ නිර්දේශය මත ඌවපරණගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇති මෙතෙක් ලියාපදිංචි නොකළ පහත නම් සඳහන් මරණාධාර/සුභ සාධක/අනෝන්‍යාධාර හා පරෝපාකාර සමිති ලියාපදිංචි කිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අ.අ. | සමිතියේ නම හා ලිපිනය |
|---|---|
| 01 | මහාමායා කාන්තා සහනාධාර සමිතිය,බෝපිටිය,වැලිඅරාව,ලුණුවත්ත. |
| 02 | විශාඛා සහනාධාර කාන්තා සමිතිය,බෝපිටිය,වැලිඅරාව,ලුණුවත්ත. |
| 03 | ස්වර්ණමාලි සුභ සාධක සමිතිය,තලාකුඹුර,පන්නල,අඹගස්දෝව. |
| 04 | ශක්ති මරණාධාර සමිතිය,දඹේවෙල ගෙදර,පේරවැල්ල. |
| 05 | වාසනා සුභ සාධක කාන්තා සමිතිය,තවලම්පොල,ඌවපරණගම |
| 06 | එක්සත් සමඟි සුභ සාධක සමිතිය,කිරවනාගම,ලුණුවත්ත. |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ඩී.එම්.ලලිත් වසන්ත දිසානායක මැතිතුමා :-**

ගරු සභාපති තුමනි, ඔබ විසින් ගෙන එන ලද සමිති ලියාපදිංචි කිරීම සම්බන්ධ වූ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති තුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රී වරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිඳු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවූ බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

පෙ.ව. 9.45ට ගරු ඩබ්.එම්.ප්‍රියන්ත බණ්ඩාර මැතිතුමා සහ ගරු එම්.එම්.අසංක කමල් බණ්ඩාර මැතිතුමා සභාවට පැමිණෙන ලදි.

**<u>යෝජනා අංක 02 – වැසිකිළි ඉදිකිරීම සඳහා ද්‍රව්‍යාධාර ලබාදීම</u>**

තිරසර සංවර්ධන අරමුණු යටතේ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා 2022 වර්ෂයේ අයවැයෙන් වෙන් කර ඇති රු.500,000.00ක මුදලින් ඌවපරණගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වැසිකිළි පහසුකම් නොමැති තෝරාගත් පවුල් දහයක් වෙනුවෙන්, රු.50,000.00ක මුදලකට යටත්ව ද්‍රව්‍යාධාර ලබාදීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ,ආර්.එම්.නාලිනි රාජපක්ෂ මැතිතුමිය :-**

ගරු සභාපති තුමනි, ඔබ විසින් ගෙන එන ලද අංක 02 යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති තුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රී වරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවූ බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

පෙ.ව. 9.50ට ගරු ඩබ්.ඒ.වසන්ත සුසිල් කුමාර මැතිතුමා සහ ගරු ඩී.එම්.කරුණාදාස මැතිතුමා සභාවට පැමිණෙන ලදි.

**<u>යෝජනා අංක 03 - බෝඹුරුඇල්ල රථගාල පස්පුරවා සකස් කිරිම - II අදියර</u>**

බෝඹුරුඇල්ල රථගාලේ බැම්ම ඉදිකිරිම I අදියර කර්මාන්තයේ වැඩ නිමකර ඇති අතර,එහි පස් පුරවා භාවිතයට ගතහැකිවන පරිදි සකස් කිරිම සඳහා සකස් කර ඇති රු.715,530.00 ක ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවටත්,අදාළ කර්මාන්තය ස්වේච්ඡා සමිතියක් මඟින් ඉටු කරවාගෙන ගෙවීම් කිරිම සුදුසු බවටත් මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ඩබ්.එම්.උපාලි වීරසිංහ මැතිතුමා :-**

ගරු සභාපති තුමනි, ඔබ විසින් ගෙන එන ලද අංක 03 යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති තුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රී වරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවූ බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 04 – ලුණුවත්ත අංක 33 කඩ කාමර පැවරීම</u>**

ලුණුවත්ත නව නගරයේ අංක 33 දරන කඩ කාමරය දැනට අඹගස්දෝව,පල්ලේවෙල,‘‘ජයසූරිය නිවස‘‘ ලිපිනයේ පදිංචි ජේ.ඒ.ගුණසේකර යන අය නමින් පවතින අතර,ඔහු මියයෑම හේතුවෙන් ඔහුගේ බිරිඳ වන අඹගස්දෝව,පල්ලේවෙල,‘‘ජයසූරිය නිවස‘‘ හි පදිංචි ජේ.එම්.ප්‍රේමාවති යන අයගේ ඉල්ලීම අනුව, ඇයට මෙම ප්‍රාදේශීය සභාවේ පවත්නා ක්‍රමවේදයට අනුව පැවරුම් ගාස්තු ලෙස රු.20,000.00ක මුදලක් හා ඊට අදාල මුද්දර ගාස්තු අය කිරිමෙන් පසු පවරා දීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ,ඊ.සෝමා එදිරිසිංහ මැතිතුමිය :-**

ගරු සභාපති තුමනි, ඔබ විසින් ගෙන එන ලද ලුණුවත්ත අංක 33 කඩ පැවරීම සම්බන්ධ වූ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති තුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රී වරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවූ බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය

**<u>යෝජනා අංක 05 – සභාව මඟින් සපයනු ලබන සේවාවන් සඳහා මිළ සංශෝධනය කිරීම</u>**

රටේ පවතින වර්තමාන ආර්ථික තත්ත්වය මත ඌවපරණගම ප්‍රාදේශීය සභාව මඟින් සිදු කරනු ලබන ආදායම් උත්පාදන මාර්ග සහ ප්‍රජා සේවාවන් සඳහා දැනට අයකරනු ලබන ගාස්තු සංශෝධනය කිරීම සුදුසු බවට 2022.03.21 දින පැවති මුදල් හා ප්‍රසම්පාදන කමිටු රැස්වීමේ දී ලබාගත් නිර්දේශය මත එකී සේවාවන් සඳහා පහත පරිදි ගාස්තු අය කිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අ.අ | සේවාව | දැනට අය කරනු ලබන මුදල රු. | සංශෝධිත මුදල රු. |
|---|---|---|---|
| 1 | බෝඹුරුඇල්ල ප්‍රවේශපත්‍ර<br>• දේශීය ටිකට්පතක්<br>• විදේශීය ටිකට්පතක් | <br>30.00<br>250.00 | <br>50.00<br>500.00 |
| 2 | ආදාහනාගාරය | 9000.00 | 12000.00 |
| 3 | ජේසිබී යන්ත්‍රය (මීටර් පැයකට) | 2250.00 | 2750.00 |
| 4 | මාර්ග තලන යන්ත්‍රය(දිනකට) | 18000.00 | 21000.00 |
| 5 | බොක් කැට් යන්ත්‍රය(මීටර් පැයකට) | 1650.00 | 1900.00 |
| 6 | ජල බවුසරය(කි.මී.1ක් සඳහා ප්‍රවාහන ගාස්තු) | 150.00 | 200.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ටී.ජී.ශ්‍රීනාත් රාජිත තිලකරත්න මැතිතුමා :-**

ගරු සභාපති තුමනි, ඔබ විසින් ගෙන එන ලද යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති තුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රී වරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී.එම්.කමල් දේශප්‍රිය දිසානායක මැතිතුමා:-**

ගරු සභාවෙන් අවසරයි.මෙම ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් අපේ විරෝධතාවය දක්වා සිටිනවා.

**ගරු සභාපතිතුමා :-**

ඒ අනුව මෙකී යෝජනාව සම්බන්ධයෙන් විරෝධතාවයක් ඉදිරිපත් වූ බැවින් ඡන්ද විමසීමක් පවත්වන ලෙස ලේකම්වරයාට දන්වන ලදී.

**යෝජනා අංක 05 සඳහා ඡන්ද විමසීම**

| අනු අංකය | නම | පක්ෂ | විපක්ෂ | නොපැමිණි හා නොසිටි |
|---|---|---|---|---|
| 1 | ගරු සභාපතිතුමා, සමින්ද සුදර්ශන මැතිතුමා | √ | | |
| 2 | ගරු උපසභාපතිතුමා,ආර්.ඩී ගුණපාල මැතිතුමා | | | √ |
| 3 | ගරු මන්ත්‍රිනි සෝමා එදිරිසිංහ මැතිතුමිය | √ | | |

| | | | | |
|---|---|---|---|---|
| 4 | ගරු මන්ත්‍රී, මෛත්‍රීපාල තෙන්නකෝන් මැතිතුමා | √ | | |
| 5 | ගරු මන්ත්‍රිනි, කාංචනා රුවන්මාලි මැතිතුමිය | √ | | |
| 6 | ගරු මන්ත්‍රී, ඩබ්ලිව්.ඒ.වසන්ත සුසිල් කුමාර මැතිතුමා | √ | | |
| 7 | ගරු මන්ත්‍රී, ජේ.එම්.බන්දුල ධර්මසිරි මැතිතුමා | √ | | |
| 8 | ගරු මන්ත්‍රී, ඩී.එම්.තිලකරත්න බණ්ඩා මැතිතුමා | √ | | |
| 9 | ගරු මන්ත්‍රී, ටී.ඒ.ශ්‍රිනාත් රාජිත තිලකරත්න මැතිතුමා | √ | | |
| 10 | ගරු මන්ත්‍රී,නාරායනන් වරදරාජ් මැතිතුමා | √ | | |
| 11 | ගරු මන්ත්‍රී, මානෙල් කුමාර රාජපක්ෂ මැතිතුමා | √ | | |
| 12 | ගැරු මන්ත්‍රිනි, ආර්.එම්.නාලනී රාජපක්ෂ මැතිතුමිය | √ | | |
| 13 | ගරු මන්ත්‍රී, ඩී.එම් ලලිත් වසන්ත දිසානායක මැතිතුමා | √ | | |
| 14 | ගරු මන්ත්‍රී,එස්.එම්. සුජිත් ප්‍රසන්න මැතිතුමා | √ | | |
| 15 | ගරු මන්ත්‍රී,කේ.එම්.කරුනාතිලක මැතිතුමා | √ | | |
| 16 | ගරු මන්ත්‍රී, ඩබ්ලිව්.පී.සමන්ත වර්ණසූරිය මැතිතුමා | √ | | |
| 17 | ගරු මන්ත්‍රී, එම්.එම්. අසංක කමල් බණ්ඩාර මැතිතුමා | √ | | |
| 18 | ගරු මන්ත්‍රී, ඩී.එම්.කරුණාදාස මැතිතුමා | √ | | |
| 19 | ගරු මන්ත්‍රී, ඒ.එම්.චමින්ද ලසන්ත අබේකෝන් මැතිතුමා | √ | | |
| 20 | ගරු මන්ත්‍රී ,එම් ජී.ඇල්බට් සරත්චන්ද්‍ර මැතිතුමා | √ | | |
| 21 | ගරු මන්ත්‍රී, ඒ.එම්.මංජු ප්‍රියනාත් අබේකෝන් මැතිතුමා | √ | | |
| 22 | ගරු මන්ත්‍රී, ඒ.පි.අසේල ඉන්ද්‍රනන්ද මැතිතුමා | | | √ |
| 23 | ගරු මන්ත්‍රී, ඩබ්ලිව්.එම්.උපාලි වීරසිංහ මැතිතුමා | √ | | |
| 24 | ගරු මන්ත්‍රිනි, එම්.එම්.සුනේත්‍රා නන්දනී මන්තිලක මැතිතුමිය | √ | | |
| 25 | ගරු මන්ත්‍රිනි, කන්දසාමි පේරාම්බිගයි මැතිතුමිය | √ | | |
| 26 | ගරු මන්ත්‍රිනි, එම්.එම් නිර්මලා පුෂ්ප කුමාරි මැතිතුමිය | √ | | |
| 27 | ගරු මන්ත්‍රී, ටි.බි සුභසේන වීරසිංහ මැතිතුමා | √ | | |
| 28 | ගරු මන්ත්‍රී, එල්.ධර්මසේන මැතිතුමා | √ | | |
| 29 | ගරු මන්ත්‍රී, ඩබ්ලිව්.ජී. විජේසිංහ මැතිතුමා | √ | | |
| 30 | ගරු මන්ත්‍රී, සින්නයියා අඩෛකලම් මැතිතුමා | √ | | |
| 31 | ගරු මන්ත්‍රිනි, ජී.දුලානි ධර්මා ගොඩකුඹුර මැතිතුමිය | √ | | |
| 32 | ගරු මන්ත්‍රිනි, ජේ.එම්.තනුජා රසාංගිකා මැතිතුමිය | | √ | |
| 33 | ගරු මන්ත්‍රී, ඩී.එම්.කමල් දේශප්‍රිය දිසානායක මැතිතුමා | | √ | |
| 34 | ගරු මන්ත්‍රී, පුනාාදාස සුගුනු කුමාර් මැතිතුමා | | | √ |
| 35 | ගරු මන්ත්‍රී, ඩබ්ලිව්.එම්.ප්‍රියන්ත බණ්ඩාර විජේතුංග මැතිතුමා | √ | | |
| 36 | ගරු මන්ත්‍රී,ඩබ්.එම් ජයසේකර මැතිතුමා | √ | | |
| 37 | ගරු මන්ත්‍රී, ටී.ඩබ්.ජී.එම් උපසේන වැවේවත්ත මැතිතුමා | √ | | |

| | |
|---|---|
| පක්ෂ | 32 |
| විපක්ෂ | 02 |
| නොපැමිණි හා සභා ගර්භයේ නොසිටි | 03 |
| මුළු ඡන්ද ගණන | 37 |

**ගරු සභාපති තුමා :-**

ඒ අනුව සභාව මඟින් සපයනු ලබන සේවාවන් සඳහා මිළ ගණන් සංශෝධනය කිරිම සම්බන්ධයෙන් බෙදීමක් ඉල්ලා සිටි බැවින් ඡන්ද විමසීමක් අනුව මත විමසුමක් පැවැත්වූවා.ඒ සඳහා පක්ෂව ඡන්ද 32ක් ද විපක්ෂව ඡන්ද 02ක්,නොපැමිණි හා සභා ගර්භයේ නොසිටි 03ක්ද සහිතව වැඩි ඡන්ද 30කින් සභාව මඟින් සපයනු ලබන සේවාවන් සඳහා මිළ ගණන් සංශෝධනය කිරිම සඳහා වූ යෝජනාව සභා සම්මත වූ බව දන්වා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ඩී.එම්.කරුණාදාස මැතිතුමා : -**

රටේ ප්‍රශ්නත් එක්ක කමල් දේශප්‍රිය මන්ත්‍රීතුමා මෙම යෝජනාවට විරුද්ධ වුණාට ගෑස් මිල වැඩිවීමත් සමඟ සභාවක් හැටියට මෙය අපට ගැටළුවක්. ගෑස් සිලින්ඩරයකින් මිනී දෙකකට ආසන්න ප්‍රමාණයක් තමයි දවන්න පුළුවන්.මේ අවස්ථාවේදී මිනිසුන්ට ගමේ මරණාධාර සමිතියේ වටිනාකම දැනෙනවා. සාමාජිකයෝ එකතුවෙලා සොහොන් භූමියේ වල කපලා මිනී වල දමනවා.

ඒවගේම සඳතැන්න,දුනිහිඳ දියඇල්ල නරඹන්න ගන්න ප්‍රවේශ පත්‍රයක මිළ දැන් කීයද? ඒනිසා අපි බෝඹුරුඇල්ල ප්‍රවේශපත්වල මිල රු.20.00ක් වැඩි කිරිම සාධාරණයි.සභාවට ආදායමක් උපයා ගන්න ස්ත්‍රීපුර,රවන්ඇල්ල සංචාරක පුරවරයක් කරලා සභාවට ආදායම් උපයා ගැනීමට කටයුතු කරමු කියන ඉල්ලීම මම කරනවා.

පෙ.ව. 10.10ට ගරු ජේ.එම්.බන්දුල ධර්මසිරි මැතිතුමා,ගරු එස්.එම්.සුජිත් ප්‍රසන්න මැතිතුමා,ගරු නාරයනන් වරදරාජ් මැතිතුමා සහ ගරු සුභසේන වීරසිංහ මැතිතුමා සභාවෙන් පිටව යන ලදි.

**<u>යෝජනා අංක 06 – දීර්ඝ කාලීන හිඟ ජල ගාස්තු කපා හැරීම</u>**

ඌවපරණගම ප්‍රාදේශීය සභාව මඟින් ජල යෝජනා ක්‍රම 13ක් පවත්වාගෙන යනු ලබන අතර, එම ජල ව්‍යාපෘතිවල 2022.03.10 දින දක්වා පවතින හිඟ ජල ගාස්තු අය කිරිම සඳහා ක්‍රියාත්මක කරන ලද හිඟ ආදායම් අය කර ගැනීමේ ක්‍රියාවලියෙන් පසු තව දුරටත් අයකරගත නොහැකි හිඟ ජල ගාස්තු පිළිබඳ සාධාරණීයකරණ වාර්තාවක් ආදායම් පරීක්ෂක මහතා විසින් ලබා දී ඇති අතර, එකී නිර්දේශයන් පරිදි තව දුරටත් අයකර ගත නොහැකිව පවතින ජල ගාස්තු ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව කපා හැරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**දීර්ඝ කාලින හිඟ ජල ලේඛනය**

| ජල යෝජනා ක්‍රමය | අනු. අං | පා,අං | නම සහ ලිපිනය | හිඟ මුදල | නොගෙවීමට හේතුව |
|---|---|---|---|---|---|
| වැලිහෙල | 1 | 96 | ඩී.එම්.සමන් දිසානායක,සම්පත,ලද්දුම. | 2145.00 | ගෙවීම් පැහැර හරියි |
| | 2 | 136 | එම්.ලාල් වසන්ත කුමාර,කොටුව,ඌවපරණගම | 2140.00 | ගෙවීම් පැහැර හරියි |
| මැටිවලලන්ද | 3 | 6 | ආර්.එම්.දුමින්ද රත්නායක,මැටිවලලන්ද,බෝවෙල | 905.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 4 | 42 | ඩබ්.පි.නන්දසේන,මැදහින්න, අක්කරමලේ | 490.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 5 | 50 | කේ.පෙරුමයියා,අක්කරමලේ,බෝවෙල | 2175.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 6 | 62 | ආර්.එම්.නිමල් සේනාරත්න,මැටිවලලන්ද,බෝවෙල | 795.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| උල්හිටිගොඩ | 7 | 28 | එම්.පිච්චේ,කෝට්ටගොඩ,ලුණුවත්ත | 2027.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 8 | 30 | එම්.ඒ.එම්.රහීම්,කෝට්ටගොඩ, ලුණුවත්ත | 1595.00 | ගම හැර ගොස් ඇත |
| | 9 | 37 | ජේ.එම්.ජෙබ්රියල්,කෝට්ටගොඩ, ලුණුවත්ත | 3720.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 10 | 41 | එච්.එම්.සිරියාවතී,කෝට්ටගොඩ, ලුණුවත්ත | 1080.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 11 | 45 | ජේ.එම් දිනදාස,පන්නලවෙල,ලුණුවත්ත | 3590.00 | ගම හැර ගොස් ඇත |
| | 12 | 54 | ස්වශක්ති සංවර්ධන පර්ෂදය,පන්නලවෙල,ලුණුවත්ත | 2380.00 | ආයතනය වසා ඇත |
| | 13 | 50 | කේ.බී.ඩබ්.ස්වර්ණලතා,කෝට්ටගොඩ, ලුණුවත්ත | 1625.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 14 | 64 | ආර්.එම්.ආරියදාස,කෝට්ටගොඩ,පන්නලවෙල | 7875.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| පන්නලවෙල | 15 | 17 | නිමල් දිසානායක,කාංචනා,පන්නලවෙල, | 4023.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 16 | 55 | ඩී.එම්.පුංචිබණ්ඩා,පන්නලවෙල,ලුණුවත්ත | 5100.00 | මිය ගොස් ඇත. |
| | 17 | 70 | ඩී.එම්.ගුණතිලක,පන්නලවෙල,ලුණුවත්ත | 645.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| කරගහඋල්පත | 18 | 31 | කේ.බී.එස්.මල්කාන්ති,නවජනපදය,කරගහඋල්පත | 2684.00 | පදිංචිය වෙනස් කර ඇත. |
| | 19 | 41 | කේ.එම්.සුදුමැණිකා,නවජනපදය,කරගහඋල්පත | 2625.00 | මිය ගොස් ඇත. |
| | 20 | 50 | එස්.එම්.මුතුබණ්ඩා,නවජනපදය,කරගහඋල්පත | 9625.00 | දැනුවත් කර ඇත. |
| | 21 | 53 | ඩබ්.ඒ.ධර්මපාල බන්දුල,නවජනපදය,කරගහඋල්පත | 2930.00 | දැනුවත් කර ඇත. |
| උණපාන | 22 | 6 | ඒ.පී.නන්දසේන,6 කණුව,කිරවල,ලුනුවත්ත | 1,040.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 23 | 7 | එස්.පී.ජයන්ත සමරකෝන්,කිරවල,ලුනුවත්ත | 3,190.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 24 | 8 | එම්.යූ.එම්.ජයසේන,කිරවල,ලුනුවත්ත | 7,160.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 25 | 17 | එච්.ඒ.විජේදාස , කිරවල, ලුනුවත්ත | 3,905.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 26 | 19 | ඒ.මනෝරංජනී,කිරවල,ලුණුවත්ත | 1,515.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 27 | 20 | එස්.එම්.ආරියසේන,කිරවල,ලුණුවත්ත | 225.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 28 | 21 | ඒ.එම්.පුංචිබණ්ඩා,මහවත්ත,කිරවල,ලුණුවත්ත | 2,125.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 29 | 25 | වයි.එම්.අබේරත්න,තැන්නපිට ගෙදර,උඩුකුඹුර,ලුණුවත්ත | 2,380.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 30 | 27 | ඒ.එම්.ජයරත්න,අඹගහවත්ත,උඩුකුඹුර,ලුණුවත්ත | 1,040.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 31 | 28 | එස්.එම්.නිමල් බණ්ඩාර,“ධම්මික සෙවන“,උඩුකුඹුර, | 2,200.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 32 | 37 | එච්.එම්.කුසුමාවති,ගෝනාව,ලූනුවත්ත | 5,640.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 33 | 40 | ජී.එම්.අනුර ධම්මික,තුෂාර නිවස,ගෝනාව,ලූනුවත්ත. | 8,630.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 34 | 52 | ජී.එම්.චිත්‍රා කුමාරි,ගෝනාව,ලූනුවත්ත | 4,210.00 | පදිංචිය හැර ගොස් ඇත. |
| | 35 | 53 | එම්.එම්.සුදුබණ්ඩා,සියඹලාගහකොටුව,උණපාන | 4,980.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 36 | 61 | ආර්.එම්.යසරත්න,උණපාන,උණපාන,ලූනුවත්ත | 2,930.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 37 | 62 | ඩබ්.පී.යසවති,මඩවලකපොල්ල,උණපාන.ලූනුවත්ත | 2,410.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 38 | 67 | ආර්.එම්.අබේපාල,ඉඩමේගෙදර,උණපාන.ලූනුවත්ත | 4,810.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 39 | 75 | ආර්.එම්.සුදුමැණිකා,උණපාන,ලූනුවත්ත | 3,190.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 40 | 82 | ඩබ්.ඒ.ගුණසේකර,උණපාන,ලූනුවත්ත | 8,400.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 41 | 83 | ඩබ්.එජ්.ජයසේන,ගල්බොක්ක,උණපාන,ලූනුවත්ත | 1,500.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 42 | 90 | කදිරවෙලි සිවලිංගම්,කිරවල,ලූනුවත්ත | 3,080.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 43 | 91 | අජිත් උපශාන්ත,ගිණිකටුගල,ලූනුවත්ත | 3,660.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 44 | 97 | ඒ.එම්.පියතිලක,ගෝනාව,ලූනුවතත | 2,485.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 45 | 99 | ආර්.එම්.උපතිස්ස,උණපාන,ලූනුවත්ත | 2,875.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 46 | 101 | ඩබ්.එම්.ජයතිලක.උණපාන,ලූනුවත්ත | 6,543.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| සරලපතන | 47 | 23 | රමණී විජේකෝන්,දියබෝකදුර,බඹරපාන | 5350.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 48 | 25 | එච්.එම්.ආරියසේන,දියබෝකදුර,බඹරපාන | 9155.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 49 | 38 | එන්.නාගලිංගම්,සරලපතන,දියබෝකදුර,බඹරපාන | 2835.00 | ගෙවීම් ප්‍රතික්ෂේප කරයි |
| | 50 | 44 | එම්.බී.රාජපක්ෂ,දියබොකදුර,බඹරපාන | 660.00 | මියගොස් ඇත |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 51 | 46 | ජෙ.එම්.ගුණසෝම බණ්ඩාර,දියබෝකදුර,බඹරපාන | 855.00 | ගෙවීම ප්‍රතික්ෂේප කරයි |
| | 52 | 56 | ආර්.එම්.සුරවීර,සරලපතන,දියබෝකදුර,බඹරපාන | 4380.00 | ගෙවීම ප්‍රතික්ෂේප කරයි |
| | 53 | 57 | ජී.ඒ.නන්දන,දියබෝකදුර,බඹරපාන | 4205.00 | නිවස හැර ගොස් ඇත |
| | 54 | 60 | ජෙ.උම්මු ෂලීමා,සරලපතන,දියබෝකදුර.බඹරපාන | 2450.00 | ගෙවීම ප්‍රතික්ෂේප කරයි |
| | 55 | 61 | ජෙ.එම්.දයාවතී,සිසිකිරන,කොටීටගොඩ,ලුනුවත්ත | 3425.00 | ගෙවීම ප්‍රතික්ෂේප කරයි |
| | 56 | 62 | වයි.ඒ.අන්සාර්,සරලපතන,දියබෝකදුර.බඹරපාන | 6505.00 | ගෙවීම ප්‍රතික්ෂේප කරයි |
| | 57 | 63 | මොහිදීන් පිච්චේ මජීඩ්,සරලපතන,දියබෝකදුර.බඹරපාන | 4440.00 | මියගොස් ඇත |
| | 58 | 66 | අබ්දුල් හමීඩ් මොහොමඩ්,සරලපතන,දියබෝකදුර.බඹරපාන | 3515.00 | මියගොස් ඇත |
| | 59 | 26 | ඩබ්.එම්.පොඩිමැණිකා,දියබෝකදුර,බඹරපාන | 3515.00 | මියගොස් ඇත |
| අඹගස්දෝව | 60 | 9 | එච්.එච්.යසවතී ද සිල්වා,නව නගරය,අඹගස්දෝව | 5,110.00 | මියගොස් ඇත |
| | 61 | 15 | එම්.එම්.පී.අප්පුහාමි බණ්ඩාර,නව නගරය.අඹගස්දෝව | 6,310.00 | ගෙවීම ප්‍රතික්ෂේප කරයි |
| | 62 | 29 | පී.එස්.එම්.ගාමිණී බණ්ඩාර,අංක 16,නව නගරය | 1,275.00 | මියගොස් ඇත |
| | 63 | 35 | ශ්‍රී ලංකා නිදහස් පක්ෂ කාර්යාලය,නව වගරය | 1,110.00 | ආයතනය වසා ඇත |
| | 64 | 39 | චන්ද්‍රලතා ධනපාල,නව නගරය.අඹගස්දෝව | 2,800.00 | මියගොස් ඇත |
| | 65 | 40 | ආර්.එම්.බිසෝමැණිකේ,සදකැළුම්,අඹගස්දෝව | 1,500.00 | මියගොස් ඇත |
| | 66 | 42 | ටී.එම්.තෙන්නකොන්,කිතුල් බැද්ද,අඹගස්දෝව | 970.00 | වසා ඇත |
| | 67 | 44 | ධර්මසේන රත්නායක,මගුල් ලියද්ද,අඹගස්දෝව | 4,160.00 | ගෙවීම ප්‍රතික්ෂේප කරයි |
| | 68 | 47 | ඩබ්.ආර්.පී.ඒ.මාලනී,කුරුදුගොල්ල.අඹගස්දෝව | 1,020.00 | ගෙවීම ප්‍රතික්ෂේප කරයි |
| | 69 | 61 | විදුහල්පති,බ/ජනාධිපති ම.වි.නව නගරය,අඹගස්දෝව | 840.00 | ගෙවීම ප්‍රතික්ෂේප කරයි |
| | 70 | 75 | කාය වර්ධන මධ්‍යස්ථානය,ප්‍රාදේශීය ලේකම් කා. | 5,490.00 | ගෙවීම ප්‍රතික්ෂේප කරයි |
| | 71 | 84 | කේ.සුජිත් නාලක මයා,සමගි පෙදෙස,අඹගස්දෝව | 1,525.00 | ගෙවීම ප්‍රතික්ෂේප කරයි |

| | | | | | |
|---|---|---|---|---|---|
| පනාගොඩ | 72 | 1 | පී.ඒ.ජයරත්න,අගතපිටිය,පනාගොඩ,බඹරපාන | 890.00 | ගෙවීම ප්‍රතික්ෂේප කරයි |
| | 73 | 89 | එම්.එම්.අබේරත්න,සමන් සිරි නිවස,පනාගොඩ | 40.00 | ගෙවීම ප්‍රතික්ෂේප කරයි |
| රත්නෝදාගම | 74 | 3 | එම්.අල්ලිමුත්තු,අංක 98,රත්නෝදාගම | 6515.00 | නිවස අතහැර ගොස් ඇත. |
| | 75 | 7 | ආර්.ඩී.ඇලිස් ,අංක 108,රත්නෝදාගම | 2060.00 | මිය ගොස් ඇත. |
| | 76 | 23 | වී.ඩී.පත්මාවති,රත්නෝදාගම | 6154.00 | නිවස විකුණා ගොස් ඇත. |
| | 77 | 33 | එච්.එම්.කරුණාවති,අංක 43,රත්නෝදාගම | 5050.00 | නිවස විකුණා ගොස් ඇත. |
| | 78 | 36 | එච්.එම්.අබේරත්න,අංක 51,රත්නෝදාගම | 2500.00 | ගෙවමින් පවතී. |
| | 79 | 51 | එම්.සරවනමුත්තු,අංක 126,රත්නෝදාගම | 966.00 | ගෙවීම් පැහැර හරියි |
| | 80 | 90 | ඒ.එම්.කරුණාදාස,අංක 4/6,රත්නෝදාගම | 950.00 | ගෙවීම් පැහැර හරියි |
| එකතුව | | | | 258822.00 | |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,එම්.එම්.අසංක කමල් බණ්ඩාර මැතිතුමා :-**

ගරු සභාපති තුමනි, ඔබ විසින් ගෙන එන ලද යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති තුමා :-**
මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රී වරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.
ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවු බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ඩබ්.පි.සමන්ත වර්ණසූරිය මැතිතුමා :-**

ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී ජල ව්‍යාපෘති සම්බන්ධයෙන් ප්‍රකාශයක් ඉදිරිපත් කලා අපේ ජල යෝජනා ක්‍රමවල ජල පිරිපහදුවක් නොමැති නිසා ඉල්ලීමක් කරන්න කියලා. ඒ අවස්ථාවේදී මම තොරතුරු ලබාගෙන ලිපියකින් ඉල්ලීම් කල බව මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ඩබ්.ජී.විජේසිංහ මැතිතුමා :-**

මැටිවලලන්ද ජල යෝජනා ක්‍රමයේ ජල බෙදුම්කරු ජල පාරිභෝගිකයින් සමඟ බහින් බස්වීම් සිදුවෙනවා. ඒවගේම එක් පවුලක් බිල ගෙවලා මාස 10ක් පමණ වුවත් මේවෙනකල් ජල මීටර් සවිකරලා නැහැ.

<u>**යෝජනා අංක 07 –LDSP ව්‍යාපෘතිය යටතේ ලුණුවත්ත නව දෙමහල් වෙළඳ සංකීර්ණය ඉදිකිරිම**</u>

LDSP ව්‍යාපෘතියේ 4 හා 5 වාරික වලට අදාළව වෙන් කර ඇති රු.මිලියන 26.06ක ප්‍රතිපාදන යොදවා ලුණුවත්ත නගරයේ අබලන්ව පවතින පැරණි දෙමහල් කඩ කාමර සහිත ගොඩනැගිල්ල ඉවත්කර නව වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,කේ.එම්.කරුණාතිලක මැතිතුමා :-**

ගරු සභාපති තුමනි, ඔබ විසින් ගෙන එන ලද යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති තුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රී වරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවූ බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය

**<u>යෝජනා අංක 08 –ප්‍රාදේශීය සභා ගරු මන්තී,ටී.එම්.මෛත්‍රීපාල තෙන්නකෝන් මැතිතුමාගේ යෝජනාව - 2022 අප්‍රේල් මස මහ සභාව සඳහා ඉදිරිපත් කරනු ලබන සුභ පැතුම් යෝජනාවයි.</u>**

මා සමඟ 1997 වසරේ පැවති ප්‍රාදේශීය සභා මැතිවරණයට අපේක්ෂකයෙකු වශයෙන් ඉදිරිපත්ව, ඉන් විශිෂ්ඨ ජයග්‍රහණයක් ලබා ගරු උප සභාපතිවරයා ලෙස පත්වී,ඉන් පසු පැවති සෑම ප්‍රාදේශීය සභා මැතිවරණයන්ගෙන් අඛණ්ඩව ජයග්‍රහණය ලැබූ වත්මන් ඌවපරණගම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති, සමින්ද සුදර්ශන කුරුප්පුආරච්චි මැතිතුමාගේ 25 වසරක දේශපාලන දිවියට අප සභාවේ සුභ පැතුම් එක් කිරිම සුදුසු යැයි මම මෙම සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි, ඊ.සෝමා එදිරිසිංහ මැතිතුමිය :-**

ගරු සභාපති තුමනි, මෛත්‍රීපාල තෙන්නකෝන් මැතිතුමා ගෙන එන ලද යෝජනාව මා ස්ථිර කරනවා.

එතුමාට ස්තූතිවන්ත වෙනවා මෙම යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන්. ගරු සභාපතිතුමා දේශපාලඥයෙක් හැටියට පහලම අදියරේ සිට සමාජයට සේවය කරන අයෙක්. 1997 සිට මම මන්ත්‍රීවරියක් වෙලා ඉන්න කාලයේ ඉදලා ඔබතුමා අඛණ්ඩව මෙතනට ආවා. ඒ කාලක්‍රියාව පිළිබඳ ප්‍රදේශයේ ජනතාවගේ පැහැදීම නිසා.ඔබතුමාට මේ දේශපාලන ගමනේ ඉදිරියටම යන්න අවශ්‍ය ශක්තිය, ධෛර්යය ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,එම්.එම්.අසංක කමල් බණ්ඩාර මැතිතුමා :-**

මම මෙතනට ඇවිත් ගරු සභාපතිතුමාගෙන් ආදර්ශයක් ලබා ගෙන ගොඩක් දේවල් ඉගෙන ගත්තා. රටේ මොන ප්‍රශ්න තිබුණත් අපි සභාවක් හැටියට වැඩ කටයුතු ඉටු කරලා තියෙනවා. අනාගතයේදී ඔබතුමාට මෙතනින් ඉහලට යන්න ශක්තිය, ධෛර්යය ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ඩබ්.ඒ.වසන්ත සුසිල් කුමාර මැතිතුමා :-**

පළමුවෙන්ම ගරු සභාපතිතුමන්ට මගේ සුභාෂිංශනය පිරිනමනවා.ඉන්න ඕන තැන නෙවෙයි අද ඉන්නේ. ඒ ගැන දුකයි. අපේ සභාව නිසි කළමනාකාරීත්වයකින් යුක්තව ගෙනයෑම සම්බන්ධයෙන් අපේ ගෞරවය පිරිනමනවා වගේම ඔබතුමාගේ ඉදිරි දේශපාලන ගමනට මගේ සුභාෂිංශනය පිරිනමනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ඒ.එම්.චමින්ද ලසන්ත මැතිතුමා :-**

ගරු සභාපතිතුමනී,ඔබගේ වසර 25ක දේශපාලන ගමනට සුභ පතනවා. ඔබතුමා අපේ ආසනයට දේශපාලනය උගන්වන ගුරුවරයෙක්. බෝඹුරුඇල්ල සංචාරක පුරවරයක් බවට පත්කර දියුණු කිරිමට වෙහෙසෙනවා. පළාත් සභා,මහ මැතිවරණයකින් ඉහලටම යෑමට ඔබතුමාට හැකියාව තිබෙනවා. ඔබතුමා එහෙම එනවානම් මම දේශපාලන පක්ෂයකින් තොරව උදව් කරන බව පවසමින් ඒ සඳහා ශක්තිය, ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මෙවැනි යෝජනාවක් ගෙන ඒම සම්බන්ධයෙන් මෛත්‍රී මන්ත්‍රීතුමාටද ස්තූතිය පුද කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි,එම්.කාංචනා රුවන්මාලි මැතිතුමිය :-**

සියලු දෙනාගෙන්ම අවසරයි. පළමුවෙන්ම මෛත්‍රී මන්ත්‍රීතුමාට ස්තූතිවන්ත වෙනවා සභාපතිතුමාට සුභ පැතුම් යෝජනාවක් ගෙන ඒම සම්බන්ධව. ඔබතුමා දේශපාලනයට ඇවිත් වසර 20ක කාලයක් මමත් දේශපාලනය කරනවා. ඔබතුමාගේ දැනුන ගුණාංගයක් තමයි ඉවසීම. ඕනෑම ප්‍රශ්නයකට ඇහුම්කන්දීලා නිරවුල් මනසින් යුක්තව ඒ ප්‍රශ්නය විසඳීමට කටයුතු කරනවා. රටේ මොන ප්‍රශ්න තිබුණත් දේශපාලන ගැටුමකට නොයා සභාවේ වැඩ කටයුතු පවත්වාගෙන යනවා. ඔබතුමා ඔතන නෙවෙයි ඉන්න ඕන. දේශපාලන ගමනේ ඉදිරියට යන්න ශක්තිය, ධෛර්යය ලැබේවා කියලා පතනවා.

මහජනතාව අසීරුතාවයකින් පෙලෙන බව අපි පිළිගත යුතුයි.ඒ අවස්ථාවේදී දේශපාලන වාසි ගන්න උත්සාහ නොකල යුතුයි. සමාජ මාධ්‍යා ජාලාවලින් ඒ පිළිබඳව දැන ගන්න ලැබෙනවා.සියලු දෙනාම එකතුවෙලා මේ රට වැටිලා තියෙන තත්ත්වයෙන් ගොඩ ගන්න උත්සාහ කල යුතුයි.  රටේ ජනතාවට ආදරයක් තියෙනවානම් 225 දෙනා එකතුවෙලා සාකච්ඡා කරලා ජනාධිපතිතුමා ඉවත්කල යුතුනම් ඒකටත් විධිවිධාන ගෙනල්ලා ව්‍යවස්ථානුකූලව කටයුතු කල යුතුයි. දේපල විනාශ කිරිම හොඳ දෙයක් නෙවෙයි.ජනතාව බුද්ධිමත්ව තීන්දු තීරණ ගත යුතුයි.88,89,71 කාලයේදීත් අහිමි වුණේ අපේ සම්පත්.ඒවා නැවත ගොඩ නගන්න මේ රටේ අහිංසක දුප්පත් මිනිසුන්ගේ සල්ලිවලින් තමයි. අපි මේ ප්‍රාදේශීය සභාව ප්‍රජාතාන්ත්‍රවාදීව අරගෙන ආවා වගේම ඉදිරියටත් කරගෙන යන්න එක්සත් ජාතික පක්ෂයේ සහයෝගය ලබා දෙනවා කියා මතක් කරමින් ඔබතුමාට හොඳ දේශපාලන ගමනක් යන්න ශක්තිය,ධෛර්යය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා.

පෙ.ව.10.35ට ගරු පුණ්‍යදාස සුගුණකුමාර් මැතිතුමා සභාවට පැමිණෙන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ඩී.එම්.කමල් දේශප්‍රිය දිසානායක මැතිතුමා :-**

ගරු සභාවෙන් අවසරයි. මම හිතනවා කාංචනා මන්ත්‍රීතුමිය ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා,තුමියන්ලා කතාකරනතුරු නිහතමානීව අපි සවන් දුන්නාසේම අපි කියන දේටත් සවන් දෙයි කියලා.කාංචනා මන්ත්‍රීතුමිය කීවා උද්ඝෝෂණ රැල්ලක් රට ඇතුලේ ව්‍යාප්ත වෙමින් යනවා. ඒවා දේශපාලන වාසි ගන්න කරන ඒවා කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි,එම්.කාංචනා රුවන්මාලි මැතිතුමිය :-**

යෝජනාවට අදාළව කතා කරන්න. මගේ කතාවට වෙනත් කතාවලදි කියන්න.

**ගරු සභාපති තුමා :-**

දැන් අපේ යෝජනා අවස්ථාව. ඒ නිසා යෝජනාවට අදාලව පමණක් කතා කරන්න.අනෙක් කරුණු වෙනත් කරුණු අවස්ථාවේ දී ඉදිරිපත් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ඩබ්.එම්.උපාලි වීරසිංහ මැතිතුමා :-**

ඌවපරණගමට තරුණ දේශපාලන නායකයෙක් හැටියට ඔබතුමාගේ හික්මීම මත අවු:25 තුල කැපිලි කෙටිලි වලට ලක්ව තමයි ප්‍රාදේශීය සභාවේ සභාපති පුටුවට ඇවිත් තියෙන්නේ. මම මගේ පවුලේ,කොට්ඨාශයේ සියළු දෙනාගේ සුභාෂිංශනය පිරිනමනවා. ඔබතුමන් ඌවපරණගම ජනතාවට සේවය කරනවාසේම බදුල්ල දිස්ත්‍රික්කයට,ඌව පළාතට ජාතික මට්ටමේ දේශපාලනයටයාමට ශක්තිය,ධෛර්යය,වාසනාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

**ගරු සභාපති තුමා :-**

ගරු මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා සියළු දෙනාගෙන් හා සභා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ සියළු දෙනාගෙන් අවසරයි. මුලින්ම මම ස්තුතිවන්ත වෙනවා මෛත්‍රීපාල තෙන්නකෝන් ගරු මන්ත්‍රීතුමාට මෙවැනි යෝජනාවක් ගෙන ඒම සම්බන්ධයෙන්. යෝජනාවට අදාලව අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමන්ලාට/තුමියන්ලාට මගේ පෞද්ගලික ගෞරවය පිරිනමනවා. පහුගිය දවසක මම ප්‍රාදේශීය සභාවේ රාජකාරි සඳහා මාර්තු 21 පැමිණෙනවිට කාර්ය මණ්ඩලයේ සියළු දෙනා එකතුවෙලා පොඩි පිළිගැනීමේ උත්සවයක් ලෑස්ති කරලා තිබුණා. මෙතන විවිධ දේශපාලන පක්ෂ තියෙනවා.මගේ සීයා වෘත්තිය සමිතියක නායකයෙක්. සීයා මාව මැතිණිගේ රැස්වීම් බලන්න එක්ක යනවා ගම්පහ දිස්ත්‍රික්කය පුරාම.6 වසරේ ඉගෙන ගන්න කාලයේ වැලිමඩ මධ්‍ය මහා විද්‍යාලයට ආවා. ඉන් පසුත් දේශපාලන රැස්වීම් පැවැත්වෙන ස්ථානවලට යනවා බලන්න. 95,96 කාලයේ ජනතා විමුක්ති පෙරමුණේ ආසන බල මණ්ඩල රැස්වීමක් තිබුණා අඹගස්දෝවේ.මම ඒකට ආවේ මගේ සමරු සටහන් පොතත් අරන්. ඒ ඇවිත් නිහාල් ගලප්පත්ති සහෝදරයාගේ සහ ටිල්වින් සිල්වා සහෝදරයාගෙන් සමරු සටහනක් තබා ගන්නවා.අදටත් සුරක්ෂිතව තියෙනවා. එවකට හිටපු ජ.වි.පෙ. නායකයා මට පණිවිඩයක් එවනවා ජ.වි.පෙ.සම්බන්ධ වෙන්න කියලා. මම 1997 ප්‍රාදේශීය සභා මැතිවරණයට ඉදිරිපත් වී ජයග්‍රහණය කරලා උප සභාපතිවරයා ලෙස මේ සභාවට එනවා. මට ජ.වි.පෙ.සම්බන්ධ වෙන්න කියපු කෙනා මේ සභාවට මන්ත්‍රීවරයෙක් වෙලා එනවා. ප්‍රාදේශීය සභා මැතිවරණයට එනකොට රු.187.00යි මා ළඟ තිබුණේ. මහජනතාව අරමුදලක් හදලා මහජනතාව තමයි ඡන්ද ව්‍යාපාරය හැදුවේ. වර්තමාන මැතිවරණ ක්‍රමය තුල සල්ලි වියදම් කරලා මනාප හොයන්න යන්න ඕන.

අපි පිළිගත යුතු දෙයක් මිනිස්සු අමාරුවෙන් ජීවත්වෙන බව. ඒකට වාදයක් නැහැ. මේ 225ම තෝරාගත්තේ මහජනතාවනේ. සන්තෝෂයට පත්වෙනවා මේ තෝරා ගැනීම පිළිබඳව යම් සංවාදයක් සමාජය තුළ මතුවීම සම්බන්ධයෙන්. අද තියෙන්නේ මිනිස්සුන්ගේ වේදනාව මාකට් කරන තත්ත්වයක්. ඒක දේශපාලනයේ ස්වභාවය. මේවා මැදිහත් සිතින් දරාගන්න සියළු දෙනාටම ශක්තිය,ධෛර්යය ලැබෙන්න කියා ප්‍රාර්ථනා කරමින් මේ යෝජනාව රැගෙන ඒම සම්බන්ධයෙන් හා අදහස් දැක්වීම සම්බන්ධයෙන් සියලු දෙනාටම ස්තූතිවන්ත වෙමින් ඊළඟ යෝජනාව සඳහා කාංචනා මන්ත්‍රීතුමියට ආරාධනා කරනවා.

**<u>හදිසි යෝජනා අංක 01 – 2022.04.07 වන පැවැත්වෙන ඌවපරණගම ප්‍රාදේශීය සභාවේ මහ සභාවට ඉදිරිපත් කිරිම සඳහා යෝජනාව</u>**

වසර 20කට ආසන්න කාලයක් කාන්තා සංවිධාන සහ සිවිල් සංවිධාන විසින් කරන ලද අරගලයක ප්‍රතිඵලයක් ලෙස ලබාගත් පළාත් පාලන ආයතන සඳහා 25% කාන්තා නියෝජනය 16%ක් දක්වා අඩු කලයුතු බවට මැතිවරණ ක්‍රම සංශෝධන පිළිබඳ තේරීම් කාරක සභාවට මහාචාර්ය සුදන්ත ලියනගේ මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව තරයේ හෙලා දකින බවත් 25% කාන්තා නියෝජනය සුරක්ෂිත කිරිම සුදුසු බවටත් මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.එම්.නාලිනි රාජපක්ෂ මැතිතුමිය :-**

ගරු සභාපති තුමනි, කාංචනා මන්ත්‍රීතුමිය විසින් ගෙන එන ලද යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති තුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රී වරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවූ බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි , ඊ.සෝමා එදිරිසිංහ මැතිතුමිය :-**

ගරු සභාපතිතුමා කල කතාවට සමගාමී කතාවක් මේක.2018 වෙනකල්ම සභාව නියෝජනය කලේ කාන්තාවන් තිදෙනයි. කාංචනා මන්ත්‍රීතුමියය,මමයි,පුණ්‍යා බුද්ධදාස මැතිණියයි.බදුල්ල දිස්ත්‍රික්කයටමත් අපි තුන්දෙනා විතරයි. කාන්තා නියෝජනය 25% ලබාගත්තේ ඉතාමත් අසීරුවෙන්. ඊලඟට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කොහොම හැදෙයිද දන්නේ නැහැ.අමාරුවෙන් ලබාගත් ජයග්‍රහණයෙන් නැවත අපට නැවත පසු බසින්න බැහැ. ඒ නිසා මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් කාංචනා මන්ත්‍රීතුමියට ස්තූතිවන්ත වෙමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන්න යනවානම් ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට ගහන එකම පහර කියමින් මා නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි, කාංචනා රුවන්මාලි මැතිතුමිය :-**

සියලු දෙනාගෙන්ම අවසරයි. සෝමා මන්ත්‍රීතුමිව කීවා වගේ මේක ලේසියෙන් ලබා ගත් ජයග්‍රහණයක් නෙවෙයි.වසර 20කට ආසන්න කාලයක් උද්ඝෝෂන කරලා ලබා ගත්ත ජයග්‍රහණයක්. 25% කෝටා එක ලබා ගත්තත් ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවල කාන්තා නියෝජනය තියෙන්නේ 25%යි. ලංකාවේ ප්‍රා දේශීය සභා දෙකක කාන්තා නියෝනයක් නැහැ. මේ 25% අඩු කිරිම සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වලා තියෙන්නේ බදුල්ල දිස්ත්‍රික්කයේ එක්තරා හෝටලයක කියන එක ආරාංචියි.මැතිවරණයට වියදම් යනවලු.කාන්තාවන්ට විතරද වියදම් යන්නේ.අපෙන් මේ ඉන්න ගරු මන්ත්‍රීතුමන්ලාට කරදරයක් හිරිහැරයක් තියෙනවාද?අපි හැමෝම එකතුවෙලා සාමකාමීව තීන්දු තීරණ අරගෙන තියෙනවා.බුදුරජාණන් වහන්සේගේ කාලයේත් රටේ කාන්තාවන් නායකත්වය ගත් අවස්ථා තිබුණා.ඒ නිසා මම මේ සභාවෙන් ඉස්මතු කරනවා ලබාගත්ත 25% ජයග්‍රහණය ආපස්සට හරවන්න නොදී මේ යෝජනාව සම්බන්ධයෙන් මැතිවරණ තේරීම් කාරක සභාවට දන්වලා යවන්න කියලා.

**ගරු සභාපති තුමා :-**
මමත් ඒකට එකඟයි.අද ජනගහන සංයුතිය ගත්තත් 25% මදි. අපි දන්වානේ මේ සභාවට 37ක් වැඩක් නැහැ කියලා. 19යි තිබුණේ. 19 යම් ප්‍රමාණයකට වැඩි වුණාට කමක් නැහැ. ඌවපරණගමට 26ක් ලැබිය යුත්තේ. ඒ කියන්නේ මේ ක්‍රමය අසාර්ථකයි කියන එකනේ. කාන්තා නියෝජනය පමණක් නොව අඩු කල යුත්තේ සමස්ත මන්ත්‍රීධූර සංඛ්‍යාවම.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී.එම්.කරුණාදාස මැතිතුමා :-**
සියලු දෙනාගෙන්ම අවසරයි. කාංචනා මන්ත්‍රීතුමිය ගෙන ආ යෝජනාව ගැන සතුටු වෙනවා. මැතිවරණ ක්‍රමයේ අඩුපාඩු තියෙනවා. ගෙදරක වුවත් කාන්තාවක් කරන වැඩ ප්‍රමාණය ගණනය කලා නම් අපි කරන වැඩවල තුන්ගුණයක් පමණ වෙනවා. කාන්තාවන්ගේ අයිතිය සුරකේවා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**<u>ගරු සභාපතිතුමාගේ හදිසි යෝජනා අංක 02 - බැකෝ ලෝඩර් යන්ත්‍රය හා ලොරි රථ කුලී පදනම මත ලබා ගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම</u>**

2022 පෙබරවාරි මස මහ සභාවේදී සභා සම්මත කරගත් යෝජනා සම්මුතියෙන් අනුමත කරන ලද රු.2,000,000.00ක ඇස්තමේන්තුවට අනුව LDSP ව්‍යාපෘතිය මඟින් නවීකරණය කිරීමට යෝජිත ලුනුවත්ත නගරයේ යෝජිත නව වෙළඳ සංකීර්ණය ඉදිකිරිමේ කර්මාන්තයේ පැරණි ගොඩනැගිල්ල ඉවත් කිරිම හා භූමියේ පස් කපා ඉවත් කිරිමේ කටයුතු වෙනුවෙන් මිළ කැඳවා,කුලී පදනම මත ලබා ගත් බැකෝ යන්ත්‍රය හා ලොරි රථ වෙනුවෙන් විජේදාස හාඩ්වෙයාර් වෙත ගෙවිය යුතු රු.1,329,200.00ක මුදල ගෙවීම් කිරිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

| | |
|---|---|
| කියුබ් 3 ලොරි රථය දින 18 ½ | = 407,000.00 |
| කියුබ් 2 ලොරි රථය දින 13 ½ | = 243,000.00 |
| කියුබ් 2 ලොරි රථය දින 16 | = <u>288,000.00</u> |
| | = <u>938,000.00</u> |
| ජේසිබි රථය පැය 130 | = <u>391,200.00</u> |
| ගෙවිය යුතු මුළු මුදල | = <u>1,329,200.00</u> |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,එම්.පී.ඒ.සරත්චන්ද්‍ර මැතිතුමා :-**

ගරු සභාපති තුමනි, ඔබ විසින් ගෙන එන ලද යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති තුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රී වරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ආර්.ඩබ්.එම්.එම්.මානෙල් කුමාර මැතිතුමා :-**

සභාපතිතුමනී,පැහැදිලි කිරිමක් කලා නම් හොඳයි.

**ගරු සභාපති තුමා :-**

මුදල් කමිටුවේ ලොරි රථ කුලියට ලබා ගැනීම සම්බන්ධයෙන් මිළ ගණන් කැඳවලා තිබුණා. ඒක අනුමත කලා. ඒ ලබාගත් සේවයට ගෙවීම් කටයුතු කිරිමට තමයි මේ යෝජනාව ඉදිරිපත් කරලා තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී.එම්.කමල් දේශප්‍රිය දිසානායක මැතිතුමා:-**

මෙවැනි යෝජනා කිහිපයක්ම හදිසි යෝජනා කියලා ඇවිත් තියෙනවා.අපට තීරණ ගන්න ගියාම අමාරුයි.මෙලෙස යෝජනා ගෙනඒම සම්බන්ධයෙන් හා අදාල ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් අපේ විරෝධතාවය දක්වා සිටිනවා.

**ගරු සභාපතිතුමා :-**

ඒ අනුව මෙකී යෝජනාව සම්බන්ධයෙන් විරෝධතාවයක් ඉදිරිපත් වු බැවින් ඡන්ද විමසීමක් පවත්වන ලෙස ලේකම්වරයාට දන්වන ලදී.

ගරු සභාපතිතුමාගේ හදිසි යෝජනා අංක 02 සඳහා ඡන්ද විමසීම

| අනු අංකය | නම | පක්ෂ | විපක්ෂ | නොපැමිණි හා නොසිටි |
|---|---|---|---|---|
| 1 | ගරු සභාපතිතුමා, සමින්ද සුදර්ශන මැතිතුමා | √ | | |
| 2 | ගරු උපසභාපතිතුමා,ආර්.ඩී ගුණපාල මැතිතුමා | | | √ |
| 3 | ගරු මන්ත්‍රිනි සෝමා එදිරිසිංහ මැතිතුමිය | √ | | |
| 4 | ගරු මන්ත්‍රි, මෛත්‍රීපාල තෙන්නකෝන් මැතිතුමා | √ | | |
| 5 | ගරු මන්ත්‍රිනි, කාංචනා රුවන්මාලි මැතිතුමිය | √ | | |
| 6 | ගරු මන්ත්‍රි, ඩබ්ලිව්.ඒ.වසන්ත සුසිල් කුමාර මැතිතුමා | √ | | |
| 7 | ගරු මන්ත්‍රි, ජේ.එම්.බන්දුල ධර්මසිරි මැතිතුමා | | | √ |
| 8 | ගරු මන්ත්‍රි, ඩී.එම්.තිලකරත්න බණ්ඩා මැතිතුමා | √ | | |
| 9 | ගරු මන්ත්‍රි, ටී.ඒ.ශ්‍රිනාත් රාජිත තිලකරත්න මැතිතුමා | √ | | |
| 10 | ගරු මන්ත්‍රි,නාරායනන් වරදරාජ් මැතිතුමා | | | √ |
| 11 | ගරු මන්ත්‍රි, මානෙල් කුමාර රාජපක්ෂ මැතිතුමා | √ | | |
| 12 | ගැරු මන්ත්‍රිනි, ආර්.එම්.නාලනී රාජපක්ෂ මැතිතුමිය | √ | | |
| 13 | ගරු මන්ත්‍රි, ඩී.එම් ලලිත් වසන්ත දිසානායක මැතිතුමා | √ | | |
| 14 | ගරු මන්ත්‍රි,එස්.එම්. සුජිත් ප්‍රසන්න මැතිතුමා | | | √ |
| 15 | ගරු මන්ත්‍රි,කේ.එම්.කරුනාතිලක මැතිතුමා | √ | | |
| 16 | ගරු මන්ත්‍රි, ඩබ්ලිව්.පී.සමන්ත වර්ණසූරිය මැතිතුමා | √ | | |
| 17 | ගරු මන්ත්‍රි, එම්.එම්. අසංක කමල් බණ්ඩාර මැතිතුමා | √ | | |
| 18 | ගරු මන්ත්‍රි, ඩී.එම්.කරුණාදාස මැතිතුමා | √ | | |
| 19 | ගරු මන්ත්‍රි, ඒ.එම්.චමින්ද ලසන්ත අබේකෝන් මැතිතුමා | √ | | |
| 20 | ගරු මන්ත්‍රි ,එම් ජී.ඇල්බට් සරත්චන්ද්‍ර මැතිතුමා | √ | | |
| 21 | ගරු මන්ත්‍රි, ඒ.එම්.මංජු ප්‍රියනාත් අබේකෝන් මැතිතුමා | √ | | |
| 22 | ගරු මන්ත්‍රි, ඒ.පි.අසේල ඉන්ද්‍රනන්ද මැතිතුමා | | | √ |
| 23 | ගරු මන්ත්‍රි, ඩබ්ලිව්.එම්.උපාලි වීරසිංහ මැතිතුමා | √ | | |
| 24 | ගරු මන්ත්‍රිනි, එම්.එම්.සුනේත්‍රා නන්දනී මන්තිලක මැතිතුමිය | √ | | |
| 25 | ගරු මන්ත්‍රිනි, කන්දසාමි පේරාම්බිගයි මැතිතුමිය | √ | | |
| 26 | ගරු මන්ත්‍රිනි, එම්.එම් නිර්මලා පුෂ්ප කුමාරි මැතිතුමිය | √ | | |
| 27 | ගරු මන්ත්‍රි, ටී.බි සුභසේන වීරසිංහ මැතිතුමා | | | √ |
| 28 | ගරු මන්ත්‍රි, එල්.ධර්මසේන මැතිතුමා | √ | | |
| 29 | ගරු මන්ත්‍රි, ඩබ්ලිව්.ජී. විජේසිංහ මැතිතුමා | | | √ |
| 30 | ගරු මන්ත්‍රි, සින්නයියා අඩෙකලම් මැතිතුමා | √ | | |
| 31 | ගරු මන්ත්‍රිනි, ජී.දූලානි ධර්මා ගොඩකුඹුර මැතිතුමිය | √ | | |
| 32 | ගරු මන්ත්‍රිනි, ජේ.එම්.තනුජා රසාංගිකා මැතිතුමිය | | √ | |
| 33 | ගරු මන්ත්‍රි, ඩී.එම්.කමල් දේශප්‍රිය දිසානායක මැතිතුමා | | √ | |
| 34 | ගරු මන්ත්‍රි, පුන්‍යාදාස සුගුනු කුමාර් මැතිතුමා | | √ | |
| 35 | ගරු මන්ත්‍රි, ඩබ්ලිව්.එම්.ප්‍රියන්ත බණ්ඩාර විජේතුංග මැතිතුමා | √ | | |
| 36 | ගරු මන්ත්‍රි,ඩබ්.එම් ජයසේකර මැතිතුමා | | | |
| 37 | ගරු මන්ත්‍රි, ටී.ඩබ්.ජී.එම් උපසේන වැවේවත්ත මැතිතුමා | | | |

| | |
|---|---|
| පක්ෂ | 27 |
| විපක්ෂ | 03 |
| නොපැමිණි හා සභා ගර්භයේ නොසිටි | 07 |
| මුළු ඡන්ද ගණන | 37 |

**ගරු සභාපති තුමා :-**

ඒ අනුව බැකෝ ලෝඩර් යන්ත්‍රය හා ලොරි රථ කුලී පදනම මත ලබා ගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම සම්බන්ධයෙන් බෙදීමක් ඉල්ලා සිටි බැවින් ඡන්ද විමසීමක් අනුව මත විමසුමක් පැවැත්වුවා.ඒ සඳහා පක්ෂව ඡන්ද 27ක් ද විපක්ෂව ඡන්ද 03ක්,නොපැමිණි හා සභා ගර්භයේ නොසිටි 07ක්ද සහිතව වැඩි ඡන්ද 24කින් බැකෝ ලෝඩර් යන්ත්‍රය හා ලොරි රථ කුලී පදනම මත ලබා ගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම සඳහා වූ යෝජනාව සභා සම්මත වූ බව දන්වා සිටින ලදී.

**06.කාරක සභා වාර්තා සලකා බැලීම -**

- **මුදල් හා ප්‍රසම්පාදන කමිටු වාර්තාව සලකා බැලීම:-**

2022 මාර්තු 21 වන දින පවත්වන ලද මුදල් හා ප්‍රසම්පාදන කමිටු වාර්තා සලකා බලා එකී නිර්දේශයන් ක්‍රියාත්මක කිරිම සුදුසු බවට සභාව අනුමත කරන ලදී.

**07.ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශන සලකා බැලීම :-**

2022.03.01 දින සිට 2022.03.31 දින දක්වා වන මාසික ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශනය සලකා බලා අනුමත කරන ලදී.

**මිළ ගණන් විවෘත කිරිම**

**I. ආදාහනාගාරය අලංකරණ කටයුතු සඳහා මිළ ගණන්**

| අ.අ | විස්තරය | මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන | | |
|---|---|---|---|---|
| | | ග්‍රීන්ලයින් ලෑන්ඩ් කේපින්, අඹගස්දෝව, වැලිමඩ | A.N.S.ෆලවර් ගාර්ඩන්ස්, ඇල්ල | CIORRA Constrations |
| 1 | ආදාහනාගාරය අවට භූමි ප්‍රදේශය අලංකරණ කටයුතු සඳහා මිළ ගණන් | 277,500.00 | 355,500.00 | 335,500.00 |

ඉහත සඳහන් මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ග්‍රීන්ලයින් ලෑන්ඩ්ස් කේපින් ආයතනයෙන් සේවාව සපයා ගැනීම සුදුසු බවට සභාව අනුමත කරන ලදී.

II. කාර්යය මණ්ඩල සමූහ ඡායාරූප සඳහා මිළ ගණන්

| අ.අ | විස්තරය | මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන | | |
|---|---|---|---|---|
| | | නිහාල් ස්ටුඩියෝ, බණ්ඩාරවෙල | ඒෂියන්ස් ස්ටුඩියෝ, හපුතලේ | සිංහෆොටෝ, වැලිමඩ |
| 1 | අගල් 12*18 වර්ණ ඡායාරූපය සහ නො.01 රාමුව (මුල් පිටපත) | 12,000.00 | 12,500.00 | 10,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 2 | කාර්යාලීය හැඳුනුම්පත (ප්ලාස්ටික්) කරපටිය සමඟ | 750.00 | 700.00 | 650.00 |
| 3 | පාස්පෝට් ප්‍රමාණයෙන් ඡායාරූපයක්(මුල්පිටපත) | 200.00 | 210.00 | 175.00 |

ඉහත මිළ ගණන් අනුව අවම මිළ ගණන් යටතේ සිංහෆොටෝ ආයතනයෙන් සේවාව සපයා ගැනීම සුදුසු බවට කමිටුව නිර්දේශ කරන ලදි.

III. ටයර් සඳහා මිළ ගණන්

| අ.අ | විස්තරය | මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන | | |
|---|---|---|---|---|
| | | රන්දිලු ටයර් සර්විස්, බණ්ඩාරවෙල පාර,වැලිමඩ | කාංචනමාලි ටයර් සර්විස්, බණ්ඩාරවෙල පාර,වැලිමඩ | M.R.F.ටයර් සර්විස්, නුවරඑළිය පාර,වැලිමඩ |
| 1 | ටයරයේ ප්‍රමාණය | 265/70/16 | 265/70/16 | 265/70/16 |
| 2 | වෙළඳ නාමය | Maxxis/Duro | Neven/Maxxis/Duro | Maxxis/Duro |
| 3 | නිෂ්පාදිත රට | තායිවාන්/ලංකා | කොරියා/තායිවාන්/ලංකා | තායිවාන්/ලංකා |
| 4 | කැන්වස් ගණන | 08/08 | 08/08/08 | 08/08 |
| 5 | වගකීම් කාලය | අවු: 01/අවු:01 | අවු: 1/මාස 6/මාස 6 | මාස6/මාස6 |
| 6 | සාමාන්‍ය කල්පැවැත්ම කි.මි. | 18000/18000 | 14000/16000/15000 | 16000/15000 |
| 7 | ඒකක මිළ | 48500.00<br>39500.00 | 48000.00<br>52000.00<br>42500.00 | 49000.00<br>41500.00 |

ඉහත සඳහන් මිළ ගණන් අනුව වසරක වගකීම් කාලයක් සහ සාමාන්‍ය කල්පැවැත්ම කි.මි.18000 ලෙස ඉදිරිපත් කර ඇති ඩියුරෝ වර්ගයේ ටයර් රු.39500.00 මිළ යටතේ ලබා ගැනීම සුදුසු බවට කමිටුව නිර්දේශ කරන ලදි.

IV. සිමෙන්ති/ඇස්බැස්ටෝස් රැලි තහඩු සඳහා මිළ ගණන්

| අ.අ | විස්තරය | මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන | | |
|---|---|---|---|---|
| | | N.M.නුහුමරික් කාර්,නො.16, බදුල්ල පාර,වැලිමඩ | මයිමූන් හාඩ්වෙයාර්, වැලිමඩ | තුෂාර ට්‍රේඩර්ස්, වැලිමඩ |
| 1 | සිමෙන්ති කොට්ට 01( 50Kg) | 2,750.00 | 2,950,00 | 2,925.00 |
| 2 | ඇස්බැස්ටෝස් රැලි තහඩු අඩි 8 | 4,200.00 | 4,500.00 | 4,790.00 |

ඉහත සඳහන් මිළ ගණන් අනුව අවම මිළ ගණන් යටතේ ද්‍රව්‍ය සපයා ගැනීම සුදුසු බවට කමිටුව නිර්දේශ කරන ලදි.

V. ජලනල සහ උපාංග සඳහා මිළ ගණන්

මේ සඳහා එස්ලෝන් ආයතනයෙන් සහ ඇන්ටන් ආයතනයෙන් මිළ ගණන් කැඳවන ලදි. නමුත් එස්ලෝන් ආයතනයෙන් මිළ ගණන් ලබාදීම ප්‍රතික්ෂේප කරන ලදි. මේ දිනවල ද්‍රව්‍යවල ක්ෂණික මිළ වෙනස්වීම නිසා උපරිම පැය 24ක කාලයකට පමණක් මිළ ගණන් ලබාදිය හැකි බව පවසන ලදි. ඇන්ටන් ආයතනයෙන් මිළ ගණන් ඉදිරිපත් කර තිබුණු අතර, එකී මිළ ගණන් යටතේ අවශ්‍යතාවය අනුව ද්‍රව්‍ය සපයා ගැනීමට කමිටුව නිර්දේශ කරන ලදි.

**08.වෙනත් කරුණු :-**

**ගරු සභාපතිතුමා :-**

අද දවසේ සභාවේ න්‍යාය පත්‍රයට අනුකූලව කටයුතු පවත්වාගෙන යාමට සහය දැක්වූ ගරු මන්ත්‍රීතුමන්ලාට,තුමියන්ලාට පළමුවෙන්ම මගේ ගෞරවනීය ස්තූතිය පුදකර සිටිනවා.ඒවගේම සභාවට ඉදිරිපත් කල යෝජනාවලට සහයෝගය දක්වමින් වෙනත් යෝජනා ඉදිරිපත් කරමින් අදහස් ප්‍රකාශ කිරිම සම්බන්ධයෙන්ද ගෞරවනීය ස්තූතිය පුද කරනවා. අපේ රටේ ඇතිවෙලා තියෙන තත්ත්වය තුල අපේ තනතුරු හෙට දවසේ නැතිවෙන්න පුළුවන්.ඒත් අපට මේ ශ්‍රී ලංකා රාජ්‍ය අතහැරලා යන්න බැහැ. ඒ නිසා වගකීමෙන් කටයුතු කල යුතුයි. අපේ රට ඉක්මනින්ම යථා තත්ත්වයට පත්වෙලා හොඳ යහපත් අනාගතයක් නිර්මාණය කර ගැනීමට අපිට හැකිවේවා කියා ප්‍රර්ථනා කරමින් සභා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් ස්තූතිවන්ත වෙනවා.

ඒ අනුව පෙ.ව.11.30 ට ගරු සභාපතිතුමා විසින් සභාවේ කටයුතු අවසන් කරන ලදි.

ස්තූතියි.

මෙයට
විශ්වාසී,

සමින්ද සුදර්ශන කුරුප්පුආරච්චි,
සභාපති,
ඌවපරණගම ප්‍රාදේශීය සභාව,
අඹගස්දෝව.

මෙම සභා වාර්තාව ...................... වන දින පැවති මහ සභාවේදී ...................................................................... ගරු මන්ත්‍රීතුමාගේ/තුමියගේ යෝජනාවෙන් .................................................................... ගරු මන්ත්‍රීතුමාගේ/තුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව/සංශෝධනයට යටත්ව සභා සම්මත විය.